# 26 ඒකකය - දත්ත නිරූපණය හා අර්ථකථනය(2)

## ➢ බහු තීර ප්‍රස්තාර

➢ එක්තරා පාසලක ගුරුවරුන් පාසලට පැමිණෙන ආකාරය පහත වගුවේ දැක්වේ.

| ප්‍රවාහන මාධ්‍යය | ගුරුවරුන් | |
|---|---|---|
| | ගැහැණු | පිරිමි |
| පයින් | 5 | 2 |
| ත්‍රිරෝද රථයෙන් | 7 | 2 |
| බසයෙන් | 3 | 5 |
| කාරයෙන් | 2 | 0 |
| මෝටර් සයිකලයෙන් | 3 | 4 |

➢ ඉහත තොරතුරු බහු තීර ප්‍රස්තාරයක දක්වන ආකාරය පහත දැක්වේ.




මෙම ප්‍රස්තාරයෙහි ද තීර සමාන පළලින් ගෙන ඇත. එක් එක් ප්‍රවර්ගයේ අනු ප්‍රවර්ග තීර එකට යාවෙන පරිදි ඇඳ ඇත. මෙවැනි ප්‍රස්තාර බහු තීර ප්‍රස්තාර ලෙස හැඳින්වේ.

පසුගිය වසරේදී සිංහල, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව,ආගම යන විෂයයන් සඳහා නිපුනි ලබාගත් ලකුණු පහත වගුවේ දක්වා ඇත. ඒවා බහු තීර ප්‍රස්තාරයක දක්වන්න.

| විෂයය | පළමු වාරය | දෙවන වාරය | තෙවන වාරය |
|---|---|---|---|
| සිංහල | 75 | 70 | 85 |
| ගණිතය | 40 | 70 | 75 |
| ඉංග්‍රීසි | 65 | 60 | 60 |
| විද්‍යාව | 65 | 55 | 70 |
| ආගම | 90 | 80 | 85 |

සිතාරා හා ප්‍රසාදි යන දෙදෙනාගේ පසුගිය මාස හයේ පාසැල් පැමිණීම පහත වගුවේ දැක්වේ. එම තොරතුරු බහු තීර ප්‍රස්තාරයක දක්වන්න.

| මාසය | පැමිණීම | |
|---|---|---|
| | සිතාරා | ප්‍රසාදි |
| ජනවාරි | 20 | 12 |
| පෙබරවාරි | 17 | 17 |
| මාර්තු | 19 | 22 |
| අප්‍රේල් | 7 | 8 |
| මැයි | 20 | 22 |
| ජූනි | 18 | 16 |